WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 33

විෂයය / பாடம்: ඉතිහාසය

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 4 |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 1 | 38. | 1 |
| 09. | 3 | 19. | 2 | 29. | 1 | 39. | 3 |
| 10. | 1 | 20. | 4 | 30. | 3 | 40. | 2 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---


පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40


අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(1). (අ) (i)




අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(1). (අ) (ii)




අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ද ඇතුළත් කොට ලෝක සිතියමක් නිර්මාණය කළ පුරාණ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා කවුරුන් ද?

*B* - ගල්පොත ශිලා ලිපිය කරවූ රජතුමාගේ නම සඳහන් කරන්න.

*C* - දුරකථනය නිපදවූ ඇමෙරිකානු ජාතිකයා කවුද?

*D* - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයාගේ නම ලියන්න.


A. ක්ලෝඩියස් ටොලමි /ටොලමි

B. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල /නිශ්ශංකමල්ල

C. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් /ග්‍රැහැම්බෙල්

D. ඩී.එස්.සේනානායක *(ලකුණු 1x4 = 4 යි)*

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රයේ දක්නට ලැබෙන උපකරණය කුමක් ද?

2. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

3. එය නිර්මාණය කරන ලද පුද්ගලයා කවුද?

4. ඔහු කුමන ජාතිකයෙක් ද?

1. දුරේක්ෂය/ දුරදක්නය

2. අභ්‍යවකාශ නිරීක්ෂණය /දුර බැලීම /ආකාශ වස්තු නිරීක්ෂණය

3. ගැලීලියෝ ගැලීලි /ගැලීලි

4. ඉතාලි *(ලකුණු 1x4 = 4 යි)*



B

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. එතුමා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ, ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණු වාදය කුමක් ද?

3. මෙතුමාගේ මග පෙන්වීම යටතේ පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?

4. මෙතුමාගේ මූලිකත්වයෙන් මෙරට ආරම්භ කරන ලද පාසලක නම ලියන්න.

WWW.OLEVELAPI.CO

1. හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා/ හෙන්රි ඕල්කොට් තුමා/ ඕල්කොට් තුමා

2. පානදුරාවාදය / පානදුරා

3. පරම විඥානාර්ථ සමාගම/ බෞද්ධ පරම විඥානාර්ථ සමාගම

4. කොළඹ ආනන්ද විද්‍යාලය/ මහනුවර ධර්මරාජ විද්‍යාලය/ගාල්ලේ මහින්ද විද්‍යාලය/ මාතලේ විජය විද්‍යාලය/ගම්පොළ ජිනරාජ විද්‍යාලය/ නාවලපිටියේ අනුරුද්ධ විද්‍යාලය

*(මින් එක් පාසලක්)*

*(ලකුණු 1x4 = 4 යි)*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II කොටස

ඉගෙනුම් පලඃ

*ඉතිහාසය ගොඩනැගීමට උපකාරීවන මූලාශ්‍රය අධ්‍යයනයෙන් විචාරාත්මක චින්තනය දියුණු කර ගනියි.*

**ප්‍රශ්න අංක 02**

**(i) ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පිළිබඳ තොරතුරු වාර්තා කළ විදේශිකයින් තිදෙනෙකුගේ නම් ලියන්න.**

(i) පාහියන් හිමි, ඉබන් බතූතා, රිබෙයිරෝ, පිලිප්පස් බැල්දියස්, රොබට් නොක්ස්

*(මින් නම් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii) ඉතිහාසය ගොඩනැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.**

(ii)
- මූලාශ්‍රය රචනා වූ කාලය
- කතුවරයා
- කතුවරයාගේ අරමුණ
- කරුණු සපයා ගත් ආකාරය

*( මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2×2 = 04)*

**(iii) පුරාවස්තු විනාශ වීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න.**

(iii)
- සීඝ්‍ර නාගරීකරණය නිසා සිදු කරන ඉදිකිරීම්
- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි භාවිතය
- නිධන් හොරුන්ගේ හානි
- පුරාවස්තු මත අකුරු ලිවීම, රූප ඇඳීම, දූර්වර්ණ කිරීම
- පුරාවස්තු ස්මාරක සොරකම් කිරීම හා විකිණීම
- පුරා විද්‍යා ස්මාරක ස්පර්ශ කිරීම

*(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2+3 =05)*

**(iv) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලබාගැනීම
- අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම
- රටේ ජාතික අනන්‍යතාව හඳුනාගැනීම
- මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

WWW.OLEVELAPI.COM

- විවිධ මත ඉවසීමට හුරු වීම
- පොත්පත් කියවීමට පෙළඹීම
- විචාරශීලී බුද්ධිය වර්ධනය වීම
- ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සෙවීම
- පෞරුෂත්වය වර්ධනය වීම

*(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 = 06)*

ඉගෙනුම් පලඃ

*මානව සංවර්ධනයේ විකාශනය පෙන්වා දෙයි.*

**ප්‍රශ්න අංක 03**

**(i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසය කළ ගල්ලෙන් තුනක් සඳහන් කරන්න.**

(i) පාහියන්ගල, කුරුවිට බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන, අත්තනගොඩ අළු ලෙන, සීගිරිය පොතාන, සීගිරිය අලිගල, පිදුරංගල, රාවණා ඇල්ල ලෙන

*(මින් තුනක් සඳහා ලකුණු 1×3= 03)*

**(ii) පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි හමු වූ ස්ථාන හතරක් සඳහන් කරන්න.**

(ii) ඉබ්බන්කටුව, ගල්සොහොන් කනත්ත, යටිගල්පොත්ත, හල්දුම්මුල්ල, බෙරගල,රංචාමඩම, නිකවලමුල්ල, කලඹටුවාව, පොම්පරිප්පු, බණ්ඩත්තර, හබරත්තාව, හේවානිවල, දුම්මලසූරිය

*(මින් හතරක් සඳහා ලකුණු 1×4 = 04)*

**(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් විස්තර කරන්න.**

(iii)
- ස්ථිර වාසස්ථාන ඉදි කරගැනීම (ස්ථිරවාසිතාවය)
- කෘෂිකර්මාන්තය හා දඩයම් කිරීම
- යකඩ හා ගල් මෙවලම් භාවිත කිරීම
- සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් තැනීම
- කාන්තාවන් රූපලාවන්‍ය කටයුතු කිරීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම

*(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 + 3= 05)*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස, පූර්ව ඓතිහාසික යුගයෙන් වෙනස්වන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv) - වැවක් කේන්ද්‍ර කොට ජනාවාස ඇතිවීම (වාපිගාම)
- භූවිෂමතාව පදනම් කරගෙන ජනාවාස පැතිරීම
- ගංගාවේ පිටාර නිම්නයට බැහැරින් නිවාස ඉදිකිරීම
- වෘත්තීන් ආශ්‍රයෙන් ජනාවාස බිහිවීම
- කාර්යය පදනම් කරගත් ජනාවාස ඇතිවීම
- කුඩා, මධ්‍ය හා නාගරික ජනාවාස ඇතිවීම
- ජනාවාසවල සංවිධානය හා පරිපාලනය ක්‍රමවත්ව පැවතීම
- ජනාවාසවල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම

*(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3 + 3= 06)*

**ඉගෙනුම් පල:**

*ඓතිහාසික යුගයට අයත් විද්‍යාව හා තාක්‍ෂණික දැනුම විස්තර කරයි.*

## ප්‍රශ්න අංක 04

**(i) අනුරාධපුර රාජධානි සමයේදී වියළි කලාපයේ ඉදිකරන ලද මහවැව් තුනක් සඳහන් කරන්න.**

(i) මින්නේරිය වැව, කවුඩුල්ල වැව, පදවිය වැව, හුරුලු වැව, නාච්චදුව වැව, මහ කනදරා වැව, කලා වැව, මහවිලච්චිය වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, යෝධ වැව, මහගල්කඩවල වැව, මානාකැටිය වැව

*(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii) වියළි කලාපයේ මහවැව් ඉදිකිරීමට හේතු දෙකක් සඳහන් කරන්න.**

(ii) - කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම
- ගංවතුර පාලනය කිරීම
- නාගරික ජල අවශ්‍යතා සපුරා ගැනීම
- වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිපදවීමට අවශ්‍ය ජලය ලබා ගැනීම
- නියං කාලවලදී ජල අවශ්‍යතා සපුරා ගැනීම
- වැසි ජලය සංරක්ෂණය කිරීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 ×2= 04)*

**(iii) වැව් බැම්ම ඉදිකිරීමේදී භාවිත කළ තාක්ෂණය නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.**

(iii) - පිහිටි ගලක් ඇසුරෙන් වැව් බැම්ම නිර්මාණය කිරීම
- ස්වභාවික කඳු දෙකක් අතර වැව් බැම්ම ඉදිකිරීම
- කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම අනුව වැව් බැම්ම ඉදිකිරීම (උදාහරණ ඃ යෝධ වැව)

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- වඩා දිගු දුරකින් වැව් බැම්ම නිර්මාණය කිරීම
- පස් තට්ටු කිහිපයක් එකිනෙක මත අතුරා තදින් තලා වැව් බැම්ම ඉදිකිරීම
- වැව් බැම්මේ ආරක්ෂාවට රළපනාව නිර්මාණය කිරීම
- පොළොවේ පාෂාණ සංයුතිය හා සමෝච්ඡ රේඛා විහිදීම සලකා බලා වැව් බැම්ම ඉදිකිරීම
- වැව් බැම්ම සැකසීමේදී පාදම වඩා පුළුල්ව ඉදිකිරීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 + 3= 05)***

**(iv) වැවක ප්‍රධාන අංග වන *A* - රළපනාව, *B* - සොරොව්ව, *C* - බිසෝකොටුව මගින් සිදුවන කාර්යයන් පිළිවෙළින් පැහැදිලි කරන්න.**

(iv) A - රළපනාව - වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීම

B - සොරොව්ව - ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම හා රොන් මඩ ඉවත් කිරීම

C - බිසෝ කොටුව - වැවක ජල පීඩනය පාලනය කර ජලය මුදා හැරීම

***(ලකුණු 3 + 3=06)***

ඉගෙනුම් පලඃ

***ඓතිහාසික සමාජයෙන් උරුම වූ සමාජ දක්ම හා පොදු භාවිත පිළිවෙත් විස්තර කරයි.***

**ප්‍රශ්න අංක 05**

**(i) මෙරට පැරණි සමාජ සංවිධාන ධූරාවලියේ ඉහළම ස්ථරයේ සිටි පාර්ශව තුනක් සඳහන් කරන්න.**

(i) රජු, රාජකීය නිලධාරීන්, සංඝරත්නය, ගිහි ප්‍රභූන් (ධනවත් වෙළෙන්දන්, නාවුක කප්පිත්තන්, වෛද්‍යවරු, ගුරුවරු)

WWW.OLEVELAPI ***(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)***

**(ii) අතීතයේ අභ්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පනවා තිබූ නීති දෙකක් සඳහන් කරන්න.**

(ii)
- වෙළෙඳපළ සීමාවේ වෙළෙඳාම් කරන අයගෙන් පමණක් බදු අය කිරීම
- සියලු වෙළෙඳ ද්‍රව්‍ය නිලධාරීන්ට පෙන්වා අනුමත කර ගැනීම
- කිරුම් මිනුම් සඳහා ප්‍රමිති ගත තරාදි පඩි භාවිත කිරීම
- බුලත් පුවක් මණ්ඩපවල තබා වෙළෙඳාම් කළ යුතු වීම
- පොහොය දිනවල වෙළෙඳාම තහනම් වීම
- පෙරමගට ගොස් භාණ්ඩ මිලදී ගැනීම තහනම් වීම

***(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 ×2= 04)***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**(iii) අතීත පාලකයින් පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.**

(iii) - උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නීති පැනවීම
- හේස්කොළන් කැපීමේදී රජය පනවා ඇති නීති රීතිවලට අනුව කටයුතු කළ යුතු වීම (හේන් වගාව සඳහා)
- නිසි කලට සීසෑම කළ යුතු වීම
- ස්වභාවික පරිසරයේ ජීවත් වන සතුන් ආරක්ෂා කිරීමට නීති පැනවීම
- පරිසරයට හානි නොවන ලෙස අප ජලය හා මල අපද්‍රව්‍ය පිට කිරීමට නිසි ක්‍රමවේද සැකසීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) මෙරට පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවනීය තත්ත්වයක් හිමි වූ බව නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv) - රාජ්‍ය පාලනය සඳහා කාන්තාවන්ට අවස්ථාව හිමිවීම
- දැඩි සමාජ බැඳීම්වලින් තොරව කටයුතු කිරීමට හැකිවීම
- මවක් ලෙස ගෞරව ලැබීම
- සූප ශාස්ත්‍රයේ නිපුණ වීම හේතුවෙන් ගෞරව දැක්වීම
- ආගමික කටයුතු සඳහා නිදහස හිමිවීම
- සාමාන්‍ය සමාජයේ කාන්තාවන්ට නායකත්වය සඳහා අවස්ථාව ලැබීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

**ඉගෙනුම් පලඃ**

*ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයමින් පැරණි නීති සම්ප්‍රදායන් පිළිබඳ අවබෝධ කර ගනියි.*

WWW.OLEVELAPI.COM

**ප්‍රශ්න අංක 06**

**(i) මහනුවර රාජධානියේ අගනගරයට ස්වාභාවික ආරක්ෂාව ලැබුණු**

**(a) ගංගාව හා**

**(b) දුර්ග මාර්ග දෙකක් සඳහන් කරන්න.**

(i) (a) මහවැලි ගඟ

(b) බලන, හුන්නස්ගිරිය, ගලගෙදර, නාලන්ද (බලකඩුව), ගිනිගත්හේන

*(ලකුණු 1×3 = 03යි)*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**(ii) මහනුවර රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු හතරදෙනා සඳහන් කරන්න.**

(ii) ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ

*(ලකුණු 1×4 = 04යි)*

**(iii) පළමුවන විමලධර්මසූරිය රජු මහනුවර රාජධානියේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.**

(iii)
- කුසුමාසන දේවිය විවාහ කර ගැනීම
- බුදු දහම වැළඳ ගැනීම
- විමලධර්මසූරිය යන බෞද්ධ නම ලබාගැනීම
- දන්ත ධාතුව මහනුවරට වැඩම කරවා ගැනීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) මහනුවර රාජධානියේ අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- ඉහළම අධිකරණය රජු වීම
- සෑම නිලධාරියකුටම තම පදවිය අනුව අධිකරණ බලතල හිමිවීම
- රජතුමා විසින්ම විසඳිය යුතු නඩු වර්ග පැවතීම
- මරණීය දණ්ඩනය පැනවීමේ බලය රජු සතුවීම
- විවිධ දඬුවම් ක්‍රම පැවතීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

ඉගෙනුම් පලඃ

*ආගන්තුක සංස්කෘතික ධාරා දේශීය සමාජ ව්‍යුහයට අනුකලනය වූ ආකාරය විග්‍රහ කරයි.*

## ප්‍රශ්න අංක 07

**(i) බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉංග්‍රීසි උගත් ශ්‍රී ලාංකිකයන්ට විවෘත වූ නව රැකියා අවස්ථා තුනක් සඳහන් කරන්න.**

WWW.OLEVELAPI.COM

(i) නීතිඥ, වෛද්‍ය, ඉංජිනේරු, මිනින්දෝරු, ලිපිකාර සේවය, සිවිල් සේවය,

*(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii) බ්‍රිතාන්‍ය පාලනයට පෙර මෙරට ජන සමාජය තුළ මුදල් භාවිතය සුලභ නොවීමට හේතු දෙකක් ලියන්න.**

(ii)
- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පැවතීම
- භාණ්ඩ හුවමාරු ක්‍රමයක් පැවතීම
- අන්‍යොන්‍ය සහයෝගය හා සහජීවන ක්‍රමයක් පැවතීම
- වැටුපට වැඩ කරන ක්‍රමයක් නොතිබීම
- අත්තම් ක්‍රමය පැවතීම

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- ගම් සභා ක්‍රමය මගින් පොදු වැඩ සිදු කිරීම
- ඉඩම් භුක්ති ක්‍රමය හා රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 × 2= 04)*

**(iii) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් මෙරට සමාජයෙහි ඇති වූ අහිතකර බලපෑම් දෙකක් විස්තර කරන්න.**

(iii)
- ඉතා දීර්ඝ කාලයක් විදේශ රාජ්‍යයක සූරා කෑමට ලක්වීම
- දේශීය ධනවතුන් සුළු පිරිසක් බිහි වුවද අති බහුතර ජනතාව දුප්පතුන් වීම
- ආදායම් බෙදී යාමේ ප්‍රබල විෂමතාව
- බටහිර සංස්කෘතිය පැතිරීම
- දේශීය සංස්කෘතිය පිරිහීම
- මධ්‍යසාර භාවිතය පැතිරීම
- ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම
- දේශීය දැනුම අභාවයට යාම
- ගම් සභාව වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) බ්‍රිතාන්‍ය පාලනය තුළින් මෙරටට ලැබුණු යහපත් ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න.**

(iv)
- ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි දැනුම රට තුළ පැතිරීම
- ගමනාගමන හා සන්නිවේදන කටයුතු දියුණු වීම
- අපනයන වැවිලි බෝග හඳුන්වාදීම
- කාර්මික විප්ලවයේ තාක්ෂණික දියුණුව මෙරටට ලැබීම
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ස්ථාපිත වීම
- බටහිර අධ්‍යාපන අවස්ථා උදාවීම
- විවිධ රැකියා ක්ෂේත්‍ර බිහිවීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

## III කොටස

**ඉගෙනුම් පලඃ**

***ඓතිහාසික ගෝලීය දේශපාලන ප්‍රවනතාවල ආදර්ශ විස්තර කරයි.***

WWW.OLEVELAPI.COM

### ප්‍රශ්න අංක 08

**(i) ඇමෙරිකා මහද්වීපයේ ජනපද පිහිටුවන ලද යුරෝපා රටවල් තුනක් සඳහන් කරන්න.**

(i) පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය

*(මින් තුනක් සඳහා ලකුණු 1×3 = 03)*

**(ii) (a) ඇමෙරිකානු නිදහස් සටනට තේමා වූ සටන් පාඨය කුමක් ද?**

**(b) රුසියානු විප්ලවයට තේමා වූ සටන් පාඨය කුමක් ද?**

(ii) (a) නියෝජිතයන් නැත්නම් බද්දත් නැත

(b) සාමය, ඉඩම්, ආහාර

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**(iii) ඇමෙරිකානු නිදහස් සටනට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න.**

(iii)
- ඇමරිකානු ජනපදවාසීන් කාලයක් තිස්සේ බ්‍රිතාන්‍යය මැදිහත්වීම අවම වූ පාලන ක්‍රමයකට හුරුවී සිටීම
- බ්‍රිතාන්‍යය අනුගමනය කළ තම රටට වාසිදායක ආර්ථික ප්‍රතිපත්තිය
- ජනපදවාසීන්ගේ සිතුම් පැතුම් ආකල්ප බ්‍රිතාන්‍ය පාලකයින් අවබෝධ කරගෙන නොසිටීම
- බ්‍රිතාන්‍යය විසින් අසාධාරණ ලෙස අණ පනත් හා නව බදු වර්ග පැනවීම
- ජනපදවාසීන්ගේ සාධාරණ සටන් මර්දනය කිරීම
- නිදහස පිළිබඳ ජනපදවාසීන් තුළ වූ උනන්දුව

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) රුසියානු විප්ලවයට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න.**

(iv)
- දූෂිත ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමය
- අධික බදු බර
- ප්‍රවේණිදාසයන් වූ සාමාන්‍ය ජනතාව ලද පීඩනය
- කම්කරුවන් ලද පීඩනය
- රුසියානු ගොවීන් හා කම්කරුවන් යුද සේවයට යොදා ගැනීම
- රට පුරා උග්‍ර ආහාර හිඟය හා භාණ්ඩවල මිල ඉහළ යාම
- ඉඩම් අයිතිය රදලවරුන් සතුවීම
- පල්ලියේ ආධිපත්‍යය
- පළමුවන ලෝක යුද්ධයට රුසියාවට සම්බන්ධ වීම නිසා රට තුළ උද්ගත වූ අර්බුද

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

ඉගෙනුම් පල:

*කාර්මික විප්ලවය හා එහි බලපෑම විග්‍රහ කරයි.*

## ප්‍රශ්න අංක 09

**(i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන කර්මාන්ත තුන ලියන්න.**

(i) පේෂ කර්මාන්තය, යකඩ හා වානේ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය

*(ලකුණු 1×3 = 03යි)*

**(ii) බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.**

(ii)
- ලොව පුරා සීඝ්‍රයෙන් ජනගහනය වර්ධනය වීම හා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම
- යුරෝපය තුළ ගමනාගමන හා ප්‍රවාහන කටයුතු වර්ධනය වීම
- ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 ×2= 04)*

www.olevelapi.com

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**(iii) කාර්මික විප්ලවයේ බලපෑම් නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.**

(iii)
- මැකඩම් ක්‍රමය හඳුන්වා දීම
- වාෂ්ප බලයෙන් ක්‍රියා කරන දුම්රිය එන්ජිම නිපදවීම
- නාවුක හා ජල ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව
  උදාහරණඃ දුම්බෝට්ටුව හා දුම් නැව
- ඩෙම්ලර් විසින් මෝටර් රථය නිපදවීම
- රයිට් සහෝදරයන් විසින් ගුවන් යානය නිපදවීම

*(මින් කරුණු දෙකක් විස්තරයට ලකුණු 2 + 3= 05)*

**(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සමාජ ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්වීම් කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

(iv)
- යහපත් මෙන්ම අයහපත් බලපෑම් ඇතිවීම
- සීඝ්‍ර නාගරීකරණය
- නාගරික ජනතාවගේ මූලික පහසුකම් අවම වීම
- වැඩ කරන ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය අසතුටු දායක වීම
- මුඩුක්කු හා පේළි නිවාස ඇතිවීම
- සමාජයේ ඇති නැති පරතරය වැඩිවීම
- පන්ති සහිත සමාජයක් බිහිවීම
- සමාජයේ විවිධ අපචාර වර්ධනය වීම
- ශ්‍රමය සූරා කෑමට ලක්වීම
- නව රැකියා අවස්ථා බිහිවීම
- ජනතාවට දැරිය හැකි මිලකට භාණ්ඩ ලබා ගැනීමට හැකිවීම
- වෘත්තීය සංගම් බිහිවීම
- සමාජ සුභසාධන කටයුතු සඳහා රාජ්‍ය අවධානය යොමුවීම
- පරිසර දූෂණය වැඩිවීම

*(මින් කරුණු තුනක් විස්තරයට ලකුණු 3 + 3= 06)*

******

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....